"රාජපක්ෂලා නැසීමට ගිනි අවි සියයක් කොළඹට...?" යන සිරස්තලයෙන් යුතුව පළවූ දිවයින ලිපියක් තුළ, සැකපිට අත්අඩංගුවට ගැනුණු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර ඇතුළු නිලධාරීන් කිහිප දෙනෙකු සම්බන්ධයෙන් අපහාසාත්මක සඳහන් කිරීම්, වරදකරුවන් ලෙසින් තීන්දු කිරීම් දක්නට ලැබිණි.

මේ සම්බන්ධයෙන් අපගේ නිරීක්ෂණයන් පහත අයුරින් පෙළ ගස්වමු.
1) ශානි අබේසේකර යනු නීතිය ඉදිරියේ තවමත් සැකකරුවෙකු නොවේද? එසේ නම් ඔහුව මෙම ලිපිය තුළ වරදකරුවෙකු ලෙසින් චිත්‍රණය වී ඇත්තේ මන්ද?

2) මෙම ලිපියේ සඳහන් අනෙකුත් නිලධාරීන් සම්බන්ධයෙන්ද චෝදනා ගොනු කෙරී, ඔවුන්ව වරදකරුවන් ලෙසින් නීතියෙන් තීරණය වී තිබේද? එසේ නොමැති නම්, මෙම දිවයින ලිපිය ඔස්සේ ඔවුන් වරදකරුවන් ලෙසින් චිත්‍රණය කරන්නේ කුමනාකාරයේ පදනමකින්ද?

3) මෙහි දැක්වෙන ආකාරයේ පුද්ගල අපහාස එල්ල කිරීම කෙතරම් මාධ්‍ය ආචාර ධර්මානුකූලද?

4) මෙම ලිපිය තුළ නිශාන්ත සිල්වා කන්දප්පා යනුවෙන් සඳහන් වුවත්, නීතිය හා අධිකරණය සම්බන්ධ නීතිමය ලියවිලි තුළ ඔහුගේ නම සඳහන් වන්නේ ඒඩ්‍රියන් නිශාන්ත සිල්වා ලෙසිනි. එසේ නම් ඔහුගේ නීත්‍යානුකූල භාවිත නාමය එය බව පිළිගැනීමට සිදුවේ. එසේ නම් මෙම පුවත් වාර්තාව තුළ එය නිශාන්ත සිල්වා කන්දප්පා ලෙසින් දැක්වෙන්නේ මන්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #Divaina